www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**වියානා නුවර යුරෝපා සංගම්-එක්සත් ජනපද සමුලුව**

# යුරෝපීය නායකයෝ බුෂ් සමග එක් වෙති

**European Union-US summit in Vienna**
**Europe's leaders close ranks with Bush**

**ස්ටීවන් ස්ටයින්බර්ග් විසිනි**
**2006 ජුනි 22**

අගහරුවාදා එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ් එක්සත් ජනපද හා යුරෝපා සංගම් නායකයන්ගේ වාර්ෂික සමුලුවට සහභාගි වනු පිනිස වියානා නුවරට ලඟා විය. වියානාහි පැවැත්වෙන කෙටි සාකච්ඡාවලින් පසුව, බුෂ් 1956 හංගේරියානු නැගිටීමේ 50 වන සංවත්සරය වෙනුවෙන් බ්‍රහස්පතින්දා බුඩාපෙස්ට් බලා යාමට නියමිත ය.

බුෂ්ගේ යුරෝපීය සංචාරය ඊලඟ සති කිහිපය තුල සිදු කෙරෙන සංචාර වටයක පලමු වැන්න යි. ඊලඟ මස ඔහු ස්ට්‍රාස්ලන්ඩ්හි දී ජර්මානු චාන්ස්ලර් ඇන්ජෙලා මර්කෙල් හමුවනු පිනිස යලි යුරෝපය බලා පැමිනෙනු ඇත. ඉන් පසුව ඔහු ජුලි 15-17 දිනවල ශාන්ත පීටර්ස්බර්ග් නුවර පැවැත්වීමට නියමිත ජී-8 සමුලුවට පෙරාතුව රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් මුන ගැසෙනු පිනිස රුසියාවට යනු ඇත.

බුෂ් කොහි ගියත්, ආරක්ෂක පූර්වෝපායන් දැවැන්ත හා බලහත්කාරී ස්වරූපයක් ගනී. වියානාහි තත්වය ද එයින් කිසි සේත් ම වෙනස් නොවී ය. ජනාධිපති හා රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් ගුවන් තොටුපලේ සිට වියානා ඉන්ටර්කොන්ටිනල් හෝටලය වෙත ගෙන ගියේ වාහන 60ක පෙරහැරකිනි. අන් සියලු වාහනවලට හා පදිකයන්ට තහනම් කෙරුනු එම මාවතේ බුෂ් ගමන් කලේ, විශේෂයෙන් ම ගුවනින් ගෙන් වන ලද ඔහුගේ ම දැවැන්ත සන්නද්ධ මෝටර් රථයෙනි. ජනාධිපති හෝටලය දක්වා ගමන් කරන කාලය තුල දී එම මාවත දෙපස සියලු නිවාස හා තට්ටු ගොඩනැගිලිවලින් ජනයා ඉවත් කල යුතු බවට එක්සත් ජනපද ආරක්ෂක නිලධාරීන් කල ඉල්ලීමකට ඔස්ට්‍රියන් ආරක්ෂක හමුදා ප්‍රතිරෝධය දක්වී ය.

එක්සත් ජනපද රහස් ඔත්තු සේවා ඒජන්තයන් හා ඔස්ට්‍රියාවේ ප්‍රභූ කෝබ්‍රා පොලීසියේ සාමාජිකයෝ බුෂ් කැටුව ගමන් කලහ. බුෂ්ගේ ආරක්ෂක කාර්ය මන්ඩලයට සීඅයිඒ ඒජන්තයන් 500ක් ඇතුලත් වූ අතර, ඔවුන්ගෙන් සමහරෙක් ජනාධිපති කැටුව පැමිනි අතර අන් අය සංචාරයට සති ගනනාවකට පෙර පැමින නගරයේ රැඳී සිටියේ ය. බුෂ් වියානාවේ සිටි පැය 20ක කාලය තුල ඔහුගේ ආරක්ෂාව පිනිස 3,000ක ඔස්ට්‍රියන් පොලිස් බලකායක් යොදවා තිබුනි. අඟහරුවාදා උදෑසන සිට බ්‍රහස්පතින්දා මධ්‍යහ්නය වන තෙක් අගනුවර අවට ගුවනේ පුලුල් කවයක් තුල පුද්ගලික ගුවන් යානා තහනම් කෙරුනි.

සමුලුව වියානාහි ඉම්පීරියල් මාලිගයෙහි පැවැත්වුනු අතර නගර අභ්‍යන්තරයේ විශාල කොටසක් රථ වාහන ගමනාගමනය සඳහා වසා දමා තිබුනි. නගර මධ්‍යයේ පිහිටි කඩ සාප්පු, ආපන ශාලා හා සංචාරක ස්ථාන 300ක් පමන වසා දැමීමට බල කෙරුනි. මූලෝපායික ස්ථානවල යොදවන ලද ස්නිපර් තුවක්කුකරුවන් ද ඇතුලත් දැඩි ආරක්ෂක මුරකාවල් මධ්‍යයේ, ජනාධිපති ආර්යාව ලෝරා බුෂ් නගර මධ්‍යයේ කෙටි සංචාරවල යෙදුනා ය.

බුෂ්ගේ සංචාරය වටා වූ පොලිස්-මිලිටරි මෙහෙයුම් ඔස්ට්‍රියානු බදු ගෙවන්නන් මත යුරෝ මිලියනයක බරක් පටවනු ඇත.

බුෂ්ගේ සංචාරයට එරෙහි විරෝධතා පසු ගිය සතියේ ඇරඹුනි. ඒ විරෝධතා කන්ඩායමක් නගර මධ්‍යයට ආසන්න තට්ටු නිවාස ගොඩනැගිල්ලක වහලය මත නැග "බුෂ් ගෙදර යනු" යන පාඨය සහිත දැවැන්ත පුවරුවක් එල්ලීමත් සමග ය. සඳුදා වියානා නගර මධ්‍යයේ ශාන්ත ස්ටීවන්ගේ දේවස්ථානය ඉදිරිපිට විරෝධතා දැක්වූවන් අත තිබූ දැවැන්ත බැනරයේ ද එම ඉල්ලීම ප්‍රදර්ශනය කෙරුනි.

බදාදා සවස 10,000කට අධික යැයි තක්සේරු කරන ලද විශාල වසයෙන් තරුනයන්ගෙන් සමන්විත පිරිසක් බුෂ්ගේ පැමිනීමට විරෝධය දක්වනු පිනිස වීදි බටහ. එක්සත් ජනපද නියෝජිත කන්ඩායම විරෝධතාකරුවන් වෙතින් බොහෝ සෙයින් ඈත් කර තැබුනු අතර සිය ගනනක පොලිස් කන්ඩායමක් විසින් වට කරන ලද එම විරෝධතාකරුවෝ ඉම්පීරියල් මාලිගයේ සිට තරමක් දුරින් පිහිටි මාවතකට සීමා කෙරුනි.

දින දෙකකට වියානා නගර මධ්‍යය සන්නද්ධ බල කොටුවක් බවට පරිවර්තනය කිරීම බොහෝ සෙයින් ඉලක්ක කර ගත්තේ, ලෝකයේ වඩාත් ම ගර්හාවට ලක් වන දේශපාලනඥයා දශ ලක්ෂ සංඛ්‍යාත යුරෝපීය පුරවැසියන්ගේ වෛරයෙන් ආරක්ෂා කර ගැනීම ය. බුෂ් වියානාවට ලගා වීමට යන්තම් දින කිහිපයකට පෙර, බ්‍රිතාන්‍ය *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද මත විමසුමකින් එලිදරව් කෙරුනේ සමස්ත යුරෝපීයයන්ගෙන් සියයට 36ක් එක්සත් ජනපදයේ විදේශ පිලිවෙත ලෝක සාමයට ඇති දවැන්තම තර්ජනය ලෙස සලකන බව යි. එම මත විමසුමේ දී ඉරානය එක්සත් ජනපදයට පිටුපසින් තරමක දුරකින් දෙවන ස්ථානයේ පසු විය.

එක්සත් ජනපද නියෝජිත කන්ඩායම සහ යුරෝපා සංගම් නායකයන් අතර සාකච්ඡාවල සංක්ෂිප්ත භාවය මගින් සහතික කෙරුනේ, යුරෝපය සහ ඇමරිකාව අතර භේදයන්ට තුඩු දී ඇති බොහෝ ක්ෂේත්‍ර (ලෝක වෙලඳ සාකච්ඡා බිඳ වැටීම, ආර්ථික ආරක්ෂනවාදයේ වැඩීම, එක්සත් ජනපද වීසා පිලිවෙත, පරිසරය, ගෝලීය මූල්‍ය අර්බුදයක තර්ජනය, මැද පෙරදිග සිට අප්‍රිකාව, නැගෙනහිර යුරෝපය සහ පැවති සෝවියට් සංගමය දක්වා බලපෑම් ක්ෂේත්‍ර අරබයා පවත්නා ගැටුම්) ඇතුලු දෑවෙන ලෝක ප්‍රශ්න කිසිවක් ගැන ගැඹුරින් සාකච්ඡා නොකෙරෙන බව යි.

සාකච්ඡා හා ඉන් අනතුරුව පැවති ප්‍රවෘත්ති සම්මන්ත්‍රන ඉරාක යුද්ධය ගැන කිසිදු සඳහනක් නොකිරීම කැපී පෙනුනි. ඉරාකයේ දිග හැරෙන ව්‍යසනය පිලිබඳව යුරෝපීය දේශපාලන කව තුල පවත්නා සැක සංකා තිබිය දී ම සහ ඉතාලිය හා ජපානය වැනි ඊනියා "කැමැත්තන්ගේ සභාගයේ" සාමාජිකයන් හැකි තරම් ඉක්මනින් ඉරාකයෙන් සිය හමුදා ඉවත් කර ගැනීමට උත්සාහ කරන තතු යටතේ, යුරෝපීය රාජ්‍ය නායකයෝ එම ප්‍රශ්නය න්‍යාය පත්‍රයෙන් ඉවත තැබීමට මහත් වෙහෙසක් ගත්හ. ඒ වෙනුවට, බුෂ්, ඉරාකයේ ඇමරිකානු වාඩිලෑම සඳහා අමතර මූල්‍ය සහ භාන්ඩ හා සේවාමය සහයෝගය ලබා දෙන ලෙස ද ඉරානයට එරෙහිව රාජ්‍යතාන්ත්‍රික පීඩනය උත්සන්න කරන ලෙස ද ඉල්ලමින් යුරෝපා සංගම් රාජ්‍ය මත පීඩනය වැඩි කිරීමට සමුලුව යොදා ගත්තේ ය.

ඇමරිකාවේ මානව අයිතීන් උල්ලංඝනයන් පිලිබඳව, මෑත මාස ගනනාවේ දී යුරෝපය තුල මතු කෙරුනු විවේචන, රැස්වීමට පසුව නිකුත් කෙරුනු සමුලු ලියවිල්ල හා ප්‍රකාශ තුල අත්පත් කර ගත්තේ හැකි තරම් දියාරු ම ප්‍රකාශනයකි. යුරෝපීය රාජ්‍ය නායකයෝ වොෂිංටනය සමග එක්සත් පෙරමුනක් ප්‍රදර්ශනය කිරීමට අධිෂ්ඨානවත්ව සිටියහ.

බදාදා පැවති ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයේ කල ආරම්භක කතාවල දී, ඔස්ට්‍රියානු චාන්ස්ලර් හා යුරෝපීය සංගමයේ වත්මන් සභාපති වුල්ෆ්ගෑන් ස්චුස්ල් සහ යුරෝපා සංගම් මන්ඩලයේ සභාපති ජෝස් මැනුවෙල් බරෝසො, අවධාරනය කලේ එක්සත් ජනපදය හා යුරෝපය එකඟ වූ කාරනා ය. ඉරානයට එරෙහිව සම්බාධක පැනවීම සඳහා බුෂ් ගෙන යන උද්ඝෝෂනයට සහාය දීමට යුරෝපා සංගමය සූදානම් යැයි ස්චුස්ල් ප්‍රකාශ කල අතර, අත්ලාන්තික් හවුල්කරුවන් අතර පවත්නා "යහපත් අධ්‍යාත්මය" ගැන බරෝසො අවධාරනය කලේ ය. බල ශක්තිය, වෙලඳාම හා බුද්ධිමය දේපොල පිලිබඳ නීති උල්ලංඝනය කරමින් කරන නිෂ්පාදන පිලිබඳව සමුලුවේ දී එකඟ වී ඇති අපැහැදිලි හා අනිවාර්ය බැඳීම් නැති යෝජනා ලැයිස්තුවක් දිග හැරීමට ද බරෝසො පියවර ගත්තේ ය.

ගුවන්තනාමො බොක්කේ සිර කඳවුර වසා දැමීමේ සිය "අභිප්‍රාය" යලි අවධාරනය කරමින් එම කඳවුර ගැන ප්‍රශ්නය මුලින් ම මතු කලේ යුරෝපීය නියෝජිතයන් නොව බුෂ් යැයි ස්චුස්ල් පෙන්වා දුන්නේ ය. ගැටලුව පවතින්නේ එක්සත් ජනපදය නියම කරන කොන්දේසි යටතේ සිරකරුවන් ආපසු බාර ගැනීමට සූදානම් නැති සෙසු රටවල් සමග යැයි බුෂ් කියා සිටියේ ය. බුෂ්ගේ මෙම අදහස් දැක්වීම් යහපත් පැත්තක් ලෙස යුරෝපීය නායකයන් විසින් සාදරයෙන් පිලිගනු ලැබී ය.

තමන්ගේ සාකච්ඡා හොඳම ආකාරයෙන් ඉදිරිපත් කිරීමටත් ප්‍රධාන කාරනා ගැන පවත්නා සිය සහයෝගිතාව අවධාරනය කිරීමටත් බුෂ්, ස්චුස්ල් හා බරෝසො දරූ ප්‍රයත්නයන් තිබිය දී ම, ඇමරිකානු පිලිවෙතට ලැබෙන යුරෝපීය මහජන සහයෝගය තියුනු ලෙස පල්ලම් බැසීම පිලිබඳ ප්‍රශ්න මග හැරීමට රැස් වූ නායකයෝ අපොහොසත් වූහ.

*ෆිනෑන්ෂල් ටයිම්ස්* වාර්තාකරු සිය පුවත්පතේ මෑත මත විමසුම පිලිබඳව බුෂ්ගෙන් ප්‍රශ්න කලේ ය. එයට ප්‍රතිචාර ලෙස "විකාරයක්" යැයි කියමින් බුෂ් මොර දුන්නේ ය. "අපි අපගේ ආරක්ෂාව සලසා ගන්නෙමු. එය විකාර ප්‍රකාශයකි." යැයි පුනරුච්චාරනය කල ඔහු කෝපයෙන්, ඊලඟ ප්‍රශ්නය මතු කරන ලෙස ඉල්ලා සිටියේ ය.

යුරෝපීය ආන්ඩුවල දැනුවත් භාවය හා අනුමැතිය ඇතිව සීඅයිඒ පැහැර ගෙන යාම් තව දුරටත් සිදු නොවනු ඇති බවට සහතිකයක් දිය හැකිදැයි, එක් අවස්ථාවක දී ඔස්ට්‍රියානු මාධ්‍යවේදියෙක් එක්සත් ජනපද හා යුරෝපීය නායකයන්ගෙන් විමසී ය. එක්සත් ජනපද පිලිවෙත පිලිබඳ ඔස්ට්‍රියානු අවිශ්වාසය සමස්තයක් ලෙස යුරෝපීය මහජනතාවගේ එම අවිශ්වාසයටත් වඩා විශාල බව පෙන්නුම් කරන මෑත මත විමසුමක් ගැන

ද එම මාධ්‍යවේදියා අවධානය යොමු කලේ ය. වත්මන් එක්සත් ජනපද පිලිවෙතට සහාය දෙන්නේ ඔස්ට්‍රියානු පුරවැසියන්ගෙන් යන්තම් සියයට 14ක් පමනක් වන අතර, ඔවුන්ගෙන් සියයට 64ක් සිතන්නේ එක්සත් ජනපදය ලෝක දේශපාලනය තුල පරාගතවාදී ක්‍රියාකලාපයක් ඉටු කරන බව යි. බුෂ්ගේ ස්ථිරසාරම සගයා වන බ්‍රිතාන්‍යයේ ටෝනි බ්ලෙයාර්ගේ දේශය තුල පවා, මහජනතාවගෙන් බහුතරයක් එක්සත් ජනපද පිලිවෙතට විරුද්ධ බව සඳහන් කිරීමට ද මාධ්‍යවේදියා පියවර ගත්තේ ය. "ඔබ අසාර්ථක වී ඇත්තේ ඇයි?" යනුවෙන් ඔහු බුෂ්ගෙන් කෙලින් ම ඇසී ය.

එක්සත් ජනපදයේ කීකරු මාධ්‍යවලට පුරුදුව සිටි බුෂ් මෙම සෘජු ප්‍රශ්නයෙන් පැහැදිලිව ම පුදුමයට පත් විය. සෙසු රටවල් මෙන් නොව, "අපි විනිවිඳ පෙනෙන ප්‍රජාතන්ත්‍රවාදී රටක්" යැයි ඔහු ඇනුම්පදයක් ලෙස කීවේ ය. ඔහු ඊලඟට "විනිවිඳ පෙනෙන ප්‍රජාතන්ත්‍රවාදය" පිලිබඳ සිය සංකල්පය විස්තාරනය කරමින් කියා සිටියේ එය වනාහි දේශපාලන නායකයන් මහජන මනෝගතියට ඇහුම්කන් නොදෙන එකක් බව යි. "මම ආන්ඩු කරන්නේ මත විමසුම් අනුව නොවේ" යැයි ඔහු පැවසී ය. "මම කරන්නේ මා නිවැරදි යැයි සිතන දේ ය. . . . මම ක්‍රියා කරන්නේ මගේ විශ්වාසයන්ට අනුව ය. මම එක්සත් ජනපදයේ ජනාධිපති ය."

කලබලයට පත්ව සිටි බාගෙට උගත් එක්සත් ජනපද ජනාධිපතිගේ ආරක්ෂාව භාර වූයේ සම්භාව්‍ය හා පැරනි ග්‍රීක භාෂාව පිලිබඳ සිය දැනුමෙන් ප්‍රයෝජන ගත් ස්චුස්ල්ට ය. ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයට කල සිය සමාප්ති කතාවේ දී ස්චුස්ල් මෙසේ ප්‍රකාශ කලේ ය: "එක්සත් ජනපදය තර්ජනයක් යැයි පැවසීම හාස්‍යජනක ය." වත්මන් ඇමරිකානු පිලිවෙත් ගැන කිසිදු සඳහනක් කිරීම මග හැරි ඔහු දෙවන ලෝක යුද්ධයට පසු කාල පරිච්ඡේදය තුල යුරෝපය සම්බන්ධයෙන් ඇමරිකාව අනුගමනය කලා යැයි කියන ත්‍යාගවන්ත පිලිවෙත ගැන මාධ්‍යවලට දේශනා පැවැත්වී ය.

බුෂ් පාලනාධිකාරයේ අර්බුදය හා එහි පිලිවෙත්වල ව්‍යසනකාරී ප්‍රතිවිපාක සම්බන්ධයෙන් සැලකූ කල, එක්සත් ජනපද ජනාධිපති ඉදිරියේ යුරෝපීය රාජ්‍ය නායකයන්ගේ යටහත් පහත් බව අතාර්කික බවක් පෙනී යා හැකි ය.

ඉරාකයේ සිය පිලිවෙතෙහි බිඳ විසිරීමකට ද සිය "කැමැත්තන්ගේ සභාගයේ" දියවී යාමකට ද බුෂ් පාලනාධිකාරය මුහුන දී සිටී. කැරලිකරුවන් ඒකාබද්ධ හමුදාවන්ට එරෙහිව නව ප්‍රහාර එල්ල කරන තතු යටතේ ඇෆ්ඝනිස්ථානයේ තත්වය ද දිනෙන් දින නරක අතට හැරෙමින් පවතී.

ඉරානයට එරෙහිව පොදු පිලිවෙතක් පිලිබඳ එකඟතාව තිබිය දී ම, යුරෝපීය නායකයෝ, මෙම තෙල්වලින් පොහොසත් රටට එරෙහි ඇමරිකානු දැඩි පිලිවෙතකින් ඇති වන ප්‍රතිවිපාක ගැන මෙන් ම එක්සත් ජනපදය හා චීනය අතර වැඩෙන ආතතීන් ගැන ද භීතියකින් පසු වෙති. එක්සත් ජනපදය හමාස් ව්‍යාපාරය දේශපාලනිකව පිටුදැකීම එල්ල කර ගත් සිය මැද පෙරදිග පිලිවෙතට සහාය දීමට යුරෝපයට බල කර ඇතත්, කලාපයේ ස්ථාවරත්වය හෝ සාමය ගැන අංශු මාත්‍රයක හෝ බලාපොරොත්තුවක් එකදු පාර්ශ්වයකට වත් නැත.

ලොව වටා කොටස් වෙලඳ පොලවල් ජාත්‍යන්තර මූල්‍ය අස්ථාවරත්වය පිලිබඳව වැඩෙන භීතිය මගින් සොලවාලනු ලැබ ඇත. කොටස් හිමියන් හා සමපේක්ෂකයන් එක්සත් ජනපද උද්ධමනයට, පොලී අනුපාතික තව දුරටත් ඉහල යාමට හා එරට දැවැන්ත මට්ටමේ නයගැති භාවයට ප්‍රතිචාර දක්වන තතු යටතේ, ජර්මානු ඩැක්ස් ඇතුලු බොහෝ යුරෝපීය වෙලඳ පොලවල් මෙම වසර තුල දී ලබා ගත් ජයග්‍රහන කොටස් විකිනීම් ප්‍රවාහයක් තුල අතු ගෑවී යන අයුරු අත් දැක ඇත.

මෙම ගැටලුවලින් එකක් වත් විසඳාලන එකදු ශක්‍ය පිලිවෙතක් වියානා සමුලුවේ දී ඉදිරිපත් වූයේ වත් සාකච්ඡා කෙරුනේ වත් නැත. තථ්‍ය වසයෙන් ගත් කල, බුෂ්ට පිටුබලය සැපයීමට යුරෝපීය නායකයන් දක්වන සූදානම බැඳී පවතින්නේ, ඔවුන් ම දක්ෂිනාංශික පිලිවෙත් අනුගමනය කිරීමට හැරී ගැනීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ම රටවල් තුල මහජන අසන්තෘප්තිය වර්ධනය වීම මෙන් ම එක්සත් ජනපදය තුල පූර්න-පරිමාන අර්බුදයක පුපුරන සුලු ආර්ථික හා සමාජ ගම්‍යයන් පිලිබඳ ඔවුන්ගේ භීතිය ද සමග ය.

පතුලට ම බැස ඇති බුෂ්ගේ ජනප්‍රියභාවය, මහා බ්‍රිතාන්‍යය තුල ටෝනි බ්ලෙයාර්ගේ හා ප්‍රන්සයේ ජැක් චිරාක්ගේ ජන-අප්‍රිය භාවය සමග සැසඳෙයි. නැගෙනහිර යුරෝපයේ සිටින බුෂ්ගේ සමීපතම සගයන් ගනනාවකගේ ම මත විමසුම් අනුපාතික ඊටත් වඩා පහල ය. ප්‍රධාන යුරෝපීය ආයතන අපකීර්තියට ලක්ව ඇති අතර යුරෝපීය ව්‍යවස්ථාව ඡන්දදායකයන් විසින් තීරනාත්මක ලෙස ප්‍රතික්ෂේප කොට ඇත.

එමෙන් ම, යුරෝපීය රාජ්‍යයන් සියල්ල ම පාහේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අපරාධවලට ඈඳී ඇත. ස්විස්ටර්ලන්ත පාර්ලිමේන්තු සභික ඩික් මාටි විසින් මෑත දී ඉදිරිපත් කරන ලද වාර්තාව මගින් එලිදරව් කෙරෙන්නේ, යුරෝපීය රටවල් 14ක් ත්‍රස්තවාදී සැකකරුවන් රහසේ ප්‍රවාහනය කිරීමේ එක්සත් ජනපද වැඩකටයුතු සමග හවුල් වී ඇති බව යි. ජර්මනිය වැනි

සෙසු රටවල් සිය රහස් ඔත්තු සේවාවන්ගේ සහභාගිත්වය හරහා ඉරාකය තුල එක්සත් ජනපද මිලිටරියට ක්‍රියාකාරීව සහාය දී තිබේ.

ජර්මනිය හා ප්‍රන්සය ඇතුලු යුරෝපීය රටවල් ගනනාවක් 2003 දී ඉරාක යුද්ධයට විරුද්ධත්වය පල කල නමුත්, වියානාවේ දී ජනාධිපති ජෝර්ජ් බුෂ් පිටුපසින් පෙල ගැසුනු එක්සත් පෙරමුන මගින් පැහැදිලි කෙරුනේ, මෙම අති සීමිත විරුද්ධත්වය මුලුමනින් ම දියවී ගොස් ඇති බව යි. අති මහත් ජාත්‍යන්තර ආතතීන්ගෙන් යුත් කාල පරිච්ඡේදයක යුරෝපා සංගම් හා එක්සත් ජනපද නායකයන් සන්නද්ධ බල කොටුවක් තුල රැස්වීම සංකේතමය අර්ථභාරයට වඩා වැඩි යමක් පෙන්නුම් කරයි. මොනම ආකාරයක වත් විකල්ප පිලිවෙතක් ඉදිරිපත් කිරීමට මුලුමනින් ම නොහැකිව හා අකැමතිව, යුරෝපීය ධනේශ්වරය අත්ලාන්තික් සාගරයෙන් අනෙක් පස සිටින සිය සගයාට මුක්කු ගැසීම මගින් තමන්ගේ ම අර්බුදයට ප්‍රතිචාර දක්වයි.

© www.wsws.org